සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2020 ජූලි

## (301) මූල්‍ය වාර්තාකරණය

(Financial Reporting)

2020-10-03
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

තිරසාරත්ව වාර්තාව (sustainability report) සහ සංකලිත වාර්තාව (integrated report) වාර්ෂික වාර්තාවේ කොටස් වේ. තිරසාරත්ව වාර්තාවක ප්‍රධාන වශයෙන් මූල්‍යමය නොවන දත්ත අඩංගු වන අතර, සංකලිත වාර්තාවක මූල්‍ය හා මූල්‍යමය නොවන යන දත්ත දෙවර්ගයම අඩංගු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) තිරසාරත්ව වාර්තාවක ප්‍රධාන අරමුණ **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) සංකලිත වාර්තාවක ඇතුළත් ප්‍රධාන සංරචක (elements) දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

වසර ගණනාවක් තුල, ගතික පරිසරයේ වෙනස්වීමත් සමඟ ගිණුම්කරණ වෘත්තියද වෙනස් වෙමින් පවතී. එබැවින් වෘත්තීය මණ්ඩල සහ ඒවායේ සාමාජිකයන්, වෘත්තියේ පැවැත්ම සහ සංවර්ධනය සඳහා අභියෝගයන්ට ප්‍රතිචාර දැක්වීම සිදුකළ යුතු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ගිණුම්කරණ වෘත්තිය මුහුණ දෙන අභියෝග තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

පොදු අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීමේදී, අස්තිත්වයක් විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතය ව්‍යාවහාර කළ යුතු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) වත්කමක්, ජංගම වත්කමක් ලෙස වර්ගීකරණය කිරීම සඳහා වූ නිර්ණායක (criteria) තුනක්(03) **සඳහන් කරන්න**.

(ලකුණු 03)

(b) වෙනත් විස්තීර්ණ ආදායම් තුළ ඇතුළත් කරනු ලබන සංරචක (components) දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**.

(ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

(a) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 - වත්කම් හානිකරණය ප්‍රමිතය අනුව, වත්කම් හානිකරණයක් හඳුනාගැනීම සඳහා සංඥා (indications) පවතී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 අනුව වත්කමක් හානිකරණය වී ඇති බව හඳුනාගැනීමට ඇති සංඥා (indications) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) සමාගමක යන්ත්‍රයේ පිරිවැය රු. මිලියන 6 ක් වන අතර, 2020 මාර්තු 31 දිනට මෙම යන්ත්‍රයේ ධාරණ අගය රු. මිලියන 3.5 කි. 2020 මාර්තු 31 දින සමාගම විසින් වත්කම් පිළිබඳව හානිකරණ පරීක්ෂාවක් (impairment loss) සිදුකරනු ලැබූ අතර, එහිදී යන්ත්‍රයේ ඉවත් කිරීමේ වියදම් අඩුකළ පසු සාධාරණ වටිනාකම සහ භාවිතයට ගැනීමේ අගය (value in use), පිළිවෙලින් රු.මිලියන 2 ක් සහ රු. මිලියන 2.5 ක් බව හෙළිදරව් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යන්ත්‍රයේ හානිකරණ අලාභය **ගණනය කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත රෝයල් (පෞද්ගලික) සමාගමේ** 2020 මාර්තු 31 දිනට සහ 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත පරිදි වේ:

**සීමාසහිත රෝයල් (පෞද්ගලික) සමාගම**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| මාර්තු 31 දිනට | 2020 | 2019 |
|---|---|---|
| **වත්කම්:** | | |
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 4,205 | 3,838 |
| සමුච්චිත ක්ෂයවීම් | (2,090) | (1,810) |
| **ධාරණ අගය** | **2,115** | **2,028** |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 1,320 | 920 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 1,723 | 1,905 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 397 | 457 |
| | **3,440** | **3,282** |
| **මුළු වත්කම්** | **5,555** | **5,310** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 1,000 | 1,000 |
| රඳවාගත් ඉපැයීම් | 960 | 820 |
| | **1,960** | **1,820** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 1,300 | 1,200 |
| | **1,300** | **1,200** |
| **ජංගම වගකීම්:** | | |
| කෙටිකාලීන ණය | 200 | 150 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 1,695 | 1,590 |
| ණය මත ගෙවිය යුතු පොලී | 180 | 100 |
| ගෙවිය යුතු ආදායම් බදු | 220 | 450 |
| | **2,295** | **2,290** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **5,555** | **5,310** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ආදායම් බදු වියදම රු.205,000/- කි.

(2) 2020 මාර්තු 31 දින සමාගම විසින් මෝටර් රථයක් රු.1,800,000/- කට විකුණන ලදී. එම මෝටර් රථයේ පිරිවැය සහ 2020 මාර්තු 31 දිනට සමුච්චිත ක්ෂය පිළිවෙලින් රු.2,500,000/- ක් සහ රු.1,250,000/- ක් විය. තවද, එදිනම සමාගම විසින් ලොරි රථයක් මිලදීගෙන තිබුණි.

(3) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණය මත පොලී වියදම රු.295,000/- කි.

(4) සමාගම විසින් එහි සාමාන්‍ය කොටස්හිමියන් සඳහා අතුරු ලාභාංශ වශයෙන් රු.100,000/- ක් වර්ෂය තුළදී ගෙවන ලදී.

(5) සමාගම විසින් රු.800,000/- ක බැංකු ණයක් වර්ෂය තුළදී ලබාගන්නා ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත රෝයල් (පෞද්ගලික) සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය <u>වක්‍ර ක්‍රමය</u> යටතේ **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(a) **සීමාසහිත ටෝකියෝ ඔටෝ (පෞද්ගලික) සමාගම,** වාහන අමතර කොටස් ශ්‍රී ලංකාවට ආනයනය කර විකිණීමේ යෙදී සිටින ව්‍යාපාර ආයතනයකි. සමාගමෙහි 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2020 මැයි 20 දින අනුමැතිය ලබාදෙන ලදී.

පහත සඳහන් තොරතුරු **සීමාසහිත ටෝකියෝ ඔටෝ (පෞද්ගලික) සමාගමට** අදාල වේ:

(1) 2020 මාර්තු 31 දිනට සමාගමට රු. මිලියන 7 ක මුදලක් අයවිය යුතුව තිබූ ගනුදෙනුකරුවෙකු 2020 අප්‍රේල් 30 දින, බංකොලොත්භාවයට පත්විය. සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මේ පිළිබඳව සැලකිල්ලක් යොමුකොට නොතිබුණි.

(2) සමාගම, සෑම වර්ෂයකම එහි පරිචයක් (practice) ලෙස සේවකයන්ට රු. මිලියන 12 ක වාර්ෂික ප්‍රසාද දීමනාවක් ගෙවනු ලැබේ. ඒ අනුව, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයෙන් ජනිත වූ ලාභය මත සේවකයන් සඳහා රු. මිලියන 12 ක වාර්ෂික ප්‍රසාද දීමනාවක් ගෙවීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2020 අප්‍රේල් 15 දින අනුමැතිය ලබාදෙන ලදී. 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මේ පිළිබඳව සැලකිල්ලට ගෙන නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 - වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් ප්‍රමිතය අනුව, ඉහත එක් එක් සිදුවීම 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ **සීමාසහිත ටෝකියෝ ඔටෝ (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගනු ලබන්නේ කෙසේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) 2019 අප්‍රේල් 01 දින **සීමාසහිත සීතා පොදු සමාගම** (කල්බදු ගැනුම්කරු) නව මෝටර් රථයක් මිලදී ගැනීම සඳහා **සීමාසහිත ABC පොදු සමාගම** (කල්බදු සමාගම) සමඟ වර්ෂ 3 ක කල්බදු ගිවිසුමකට ඇතුළත් වන ලදී. කල්බදු ගිවිසුමට අනුව **සීමාසහිත සීතා පොදු සමාගම** රු.400,000/- ක මුදලක් කල්බද්ද ආරම්භක දිනයේදී ගෙවූ අතර, ඉතිරිය රු.1,413,600/- බැගින් වූ වාර්ෂික කල්බදු වාරික වශයෙන් එක් එක් වර්ෂයේ මාර්තු 31 දින ගෙවිය යුතු වේ. කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතය 14% කි. කල්බදු ගිවිසුමේ සඳහන් වන පරිදි අදාල මෝටර් රථයේ හිමිකාරිත්වය කල්බදු කාලසීමාව අවසානයේදී **සීමාසහිත සීතා පොදු සමාගමට** මාරු වේ.

*(සටහන: කල්බදු වාරිකය නියමිත දිනට ගෙවා ඇති බවට උපකල්පනය කරන්න.)*

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත ගනුදෙනුවට අදාලව කල්බදු ගැනුම්කරුගේ 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘතය (extract) **පිළියෙල කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

**සීමාසහිත P සමාගමේ** ගිණුම් පොත්වලින් 2020 මාර්තු 31 දිනට පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

(1) ජංගම නොවන වත්කම්වල විස්තර පහත පරිදි වේ: *(රු.'000)*

| **වත්කම** | **පිරිවැය** | **2020 මාර්තු 31 දිනට ධාරණ අගය (ගිණුම්කරණ ලියාහල අගය)** | **බදු අරමුණු සඳහා සමුච්චිත ක්ෂය (ප්‍රාග්ධන දීමනාව)** |
|---|---|---|---|
| ඉඩම | 10,000 | - | - |
| පිරියත සහ උපකරණ | 40,000 | 32,500 | 16,300 |

(2) 2020 මාර්තු 31 දිනට පාරිතෝෂික සඳහා වෙන්කිරීම රු.12,000,000/- ක් විය.

(3) 2019 අප්‍රේල් 01 දිනට විලම්බිත බදු වගකීම රු.810,000/- ක් විය.

(4) **සීමාසහිත P සමාගම,** වර්ෂයකට 14% බැගින් ආදායම් බදු ගෙවනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2020 මාර්තු 31 දිනට තාවකාලික වෙනස්කම් (temporary differences) **හඳුනා දක්වන්න**. (ලකුණු 06)

(b) 2020 මාර්තු 31 දිනට විලම්බිත බදු වත්කම / වගකීම **ගණනය කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

## **08** වන ප්‍රශ්නය

**සීමාසහිත ඩෙල්ටා සමාගමේ** 2020 මාර්තු 31 සහ 2019 මාර්තු 31 දිනයන්ට / දිනෙන් අවසන් වර්ෂ සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතය** *(රු.'000)*

| **දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2020 මාර්තු 31** |
|---|---:|
| විකුණුම් | 92,500 |
| විකුණුම් පිරිවැය | 62,900 |
| දළ ලාභය | 29,600 |
| පොලී සහ ආදායම් බදුවලට පෙර ලාභය | 10,700 |
| පොලී වියදම් | 2,200 |
| ආදායම් බදුවලට පසු ලාභය | 5,500 |

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘතය** *(රු.'000)*

| **දිනට** | **2020 මාර්තු 31** | **2019 මාර්තු 31** |
|---|---:|---:|
| තොග | 15,000 | 16,500 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 11,700 | 12,700 |
| ජංගම වත්කම් | 31,300 | 34,000 |
| ජංගම වගකීම් | 19,000 | 17,500 |
| ස්කන්ධය | 16,500 | 11,000 |
| දිගුකාලීන ණය | 4,500 | 6,000 |

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ඩෙල්ටා සමාගම,** පහත සඳහන් අනුපාතයන් ගණනය කර තිබුණි:

| | |
|---|---:|
| දළ ලාභ අනුපාතය | 30% |
| ශුද්ධ ලාභ අනුපාතය | 10% |
| ණයගැති එකතුකිරීමේ කාලය | දින 45 |
| තොග නේවාසික කාලය | දින 85 |
| ජංගම අනුපාතය | 1.94 : 1 |
| පොලී ආවරණ අනුපාතය | වාර 4 |

සියලුම විකුණුම් ණය පදනම මත සිදුකරන බව උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට පහත සඳහන් අනුපාත **ගණනය කරන්න**:

(i) දළ ලාභ අනුපාතය.

(ii) ශුද්ධ ලාභ අනුපාතය.

(iii) ණයගැති එකතුකිරීමේ කාලය.

(iv) තොග නේවාසික කාලය.

(v) ජංගම අනුපාතය.

(vi) පොලී ආවරණ අනුපාතය. (ලකුණු 06)

(b) පසුගිය වර්ෂය සඳහා ගණනය කරන ලද අනුපාතයන් සැලකිල්ලට ගනිමින්, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට **සීමාසහිත ඩෙල්ටා සමාගමේ** කාර්යසාධනය **විශ්ලේෂණය කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 12)

## 09 වන ප්‍රශ්නය

**සීමාසහිත සත් පොදු සමාගමේ** සහ **සීමාසහිත මුත් පොදු සමාගමේ** 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන් පහත පරිදි වේ:

**2020 මාර්තු 31 දිනට**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| | සීමාසහිත සත් පොදු සමාගම | සීමාසහිත මුත් පොදු සමාගම |
|---|---|---|
| **වත්කම්:** | | |
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට | 80,000 | 42,000 |
| සමුච්චිත ක්ෂය | (34,000) | (6,000) |
| ධාරණ අගය | 46,000 | 36,000 |
| **සීමාසහිත මුත් පොදු සමාගමේ** ආයෝජනය | 40,000 | - |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 12,000 | 13,500 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 8,000 | 9,000 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 2,000 | 2,500 |
| **මුළු වත්කම්** | **108,000** | **61,000** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 70,000 | 40,000 |
| රඳවාගත් ඉපැයීම් | 16,700 | 8,000 |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් | 21,300 | 13,000 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **108,000** | **61,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2019 අප්‍රේල් 01 දින **සීමාසහිත සත් පොදු සමාගම** විසින් **සීමාසහිත මුත් පොදු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් අත්පත් කරගන්නා ලදී.

(2) අත්පත් කරගත් දිනට පාලනය නොවන හිමිකමේ සාධාරණ අගය රු. මිලියන 10 ක් විය. අත්පත් කරගත් දිනට **සීමාසහිත මුත් පොදු සමාගමේ** රඳවාගත් ඉපැයීම් රු. මිලියන 5 ක් වූ අතර, **සීමාසහිත මුත් පොදු සමාගමේ** හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සාධාරණ අගය එහි පොත් අගයට සමාන විය.

(3) 2019 අප්‍රේල් 01 දින, **සීමාසහිත සත් පොදු සමාගම** විසින් **සීමාසහිත මුත් පොදු සමාගමට** මෝටර් රථයක් රු. මිලියන 5 කට විකුණන ලදී. **සීමාසහිත සත් පොදු සමාගම** විසින් මෙම මෝටර් රථය 2018 අප්‍රේල් 01 දින රු. මිලියන 4 කට මිලදීගෙන තිබුණි. සමාගම් දෙකම, මෝටර් රථ, පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට වර්ෂ 5 ක් තුළ ක්ෂය කරනු ලබයි.

(4) 2020 මාර්තු මාසය තුළදී, **සීමාසහිත මුත් පොදු සමාගම** විසින් පිරිවැය රු. මිලියන 3 ක් වටිනා භාණ්ඩ තොගයක් පිරිවැයට 20% ක ලාභ ආන්තිකයක් සහිතව **සීමාසහිත සත් පොදු සමාගමට** විකුණා ඇත. 2020 මාර්තු 31 දිනට, **සීමාසහිත සත් පොදු සමාගම** සතුව පැවති තොගය තුළ **සීමාසහිත මුත් පොදු සමාගමෙන්** මිලට ගත් භාණ්ඩවලින් 50% ක නොවිකුණු තොගයක් පැවතුණි. තවද, මෙම ගනුදෙනුවට අදාල සම්පූර්ණ මුදල **සීමාසහිත මුත් පොදු සමාගමේ** වෙළෙඳ ලැබිය යුතු මුදල්හි සහ **සීමාසහිත සත් පොදු සමාගමේ** වෙළෙඳ ගෙවිය යුතු මුදල්හි වාර්තාකොට ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඒකාබද්ධ කිරීමේදී ඇතිවන කීර්තිනාමය **ගණනය කරන්න**. (ලකුණු 03)

(b) 2020 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 10)

(මුළු ලකුණු 13)

## 10 වන ප්‍රශ්නය

**සීමාසහිත ඩයනා සමාගමේ** 2020 මාර්තු 31 දිනට පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත:

**සීමාසහිත ඩයනා සමාගම**

**2020 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 5,000,000) | | 50,000 |
| 2019 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 17,000 |
| **දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට:** | | |
| ඉඩම සහ ගොඩනැගිලි (ඉඩමේ වටිනාකම රු. මිලියන 20 කි.) | 32,000 | |
| මෝටර් වාහන | 7,300 | |
| පරිගණක මෘදුකාංග | 12,000 | |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 8,200 | |
| **2019 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| ගොඩනැගිලි | | 4,800 |
| මෝටර් වාහන | | 3,200 |
| පරිගණක මෘදුකාංග | | 3,000 |
| 2020 මාර්තු 31 දිනට, තොගය | 39,400 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 28,100 | 29,100 |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 10,700 | |
| 2019 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 3,400 |
| ගෙවූ ආදායම් බදු | 1,300 | |
| ගෙවූ අතුරු ලාභාංශ - සාමාන්‍ය කොටස් | 5,000 | |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 198,500 | 281,900 |
| වෙනත් ආදායම් | | 3,000 |
| 12% බැංකු ණය | | 4,000 |
| 2019 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු ආදායම් බදු | | 750 |
| පරිපාලන වියදම් | 30,350 | |
| බෙදාහැරීමේ වියදම් | 23,400 | |
| මූල්‍ය වියදම් | 8,400 | |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම) | | 4,500 |
| | **404,650** | **404,650** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2020 මාර්තු 31 දිනට පැවති තොගය තුළ පිරිවැය රු.800,000/- ක් වූ යල්පැන ගිය තොගයක් ඇතුළත්ය. මෙම තොගය රු.400,000/- කට 2020 අප්‍රේල් 30 දින ගැනුම්කරුවෙකුට විකුණූ අතර, ඒ සඳහා අමතර ප්‍රවාහන ගාස්තු ලෙස රු.100,000/- ක් දැරීමට සිදුවිය.

(2) 2019 ඔක්තෝම්බර් 01 දින, සමාගම විසින් පිරිවැය රු.7,000,000/- ක් වූ පරිගණක මෘදුකාංග පද්ධතියක් අත්පත් කරගත් අතර, එම පිරිවැය, පරිගණක මෘදුකාංග ගිණුමේ සටහන්කොට ඇත. එදිනම, සමාගම විසින් රු.2,000,000/- ක පිරිවැයක් දරා එම මෘදුකාංග පද්ධතිය සමාගමේ ව්‍යාපාරික කටයුතුවලට සුදුසු පරිදි සංවර්ධනය කරගන්නා ලද අතර, එම පරිගණක මෘදුකාංගවලට අදාල සංවර්ධන පිරිවැය, පරිපාලන වියදම් යටතේ ගිණුම්ගත කොට ඇත.

(3) නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සමාගම විසින් 12% ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ රු. මිලියන 5 ක බැංකු ණයක් 2019 ජූනි 30 දින ලබාගන්නා ලද අතර, ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2019 ජූලි 01 දින ආරම්භ කළේය. 2020 මාර්තු 31 දිනට මෙහි ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පැවති අතර, 2020 ඔක්තෝම්බර් මස අවසානයේදී ඉදිකිරීම් කටයුතු නිමකිරීමට අපේක්ෂිතය. වර්ෂය තුළ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා දරණ ලද පිරිවැය, ප්‍රාග්ධන නොනිමි වැඩ ගිණුමට හර කර තිබේ. වර්ෂය සඳහා ණය මුදලේ පොලිය වූ රු.450,000/- , මූල්‍ය වියදම් යටතේ සටහන්කොට ඇත. 2020 මාර්තු 31 දිනට පවතින බැංකු ණය මුදලේ ශේෂයෙන් ¼ ක් ඉදිරි වර්ෂය තුළදී පියවිය යුතුය.

(4) 2020 මාර්තු 31 දින, සමාගම විසින් එහි ඉඩම රු.23,700,000/- කට ප්‍රත්‍යාගණනය කරනු ලැබූ අතර, එය ගිණුම් පොත්වල වාර්තා කොට නොතිබුණි.

(5) පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂයවීම් ගණනය කරනු ලබන අතර, දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයුකාලය පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂ 50 |
| මෝටර් වාහන | : | වර්ෂ 04 |
| පරිගණක මෘදුකාංග | : | වර්ෂ 05 |

(6) වර්ෂය තුළදී, සමාගම විසින් පසුගිය වසරේදී බොල්ණය ලෙස කපාහරින ලද ණයගැතියෙකුගෙන් රු.1,500,000/- ක මුදලක් නැවත අයකරගෙන ඇති අතර, එම මුදල වෙළෙඳ ලැබිය යුතු මුදල් ගිණුමට බැරකොට ඇත. තවද, 2020 මාර්තු 31 දිනට පවතින වෙළෙඳ ලැබිය යුතු මුදල් ගිණුමේ ශේෂය මත 10% ක පොදු වෙන්කිරීමක් ද සිදුකළ යුතුව ඇත.

(7) 2020 සම්පූර්ණ ලිත් වර්ෂය සඳහා ගෙවනු ලැබූ රු.1,200,000/- ක රක්ෂණ ගෙවීම, පරිපාලන වියදම් යටතේ ගිණුම්ගතකොට ඇත.

(8) 2020 මාර්තු 31 දිනට පහත සඳහන් වියදම් උපචිත කළ යුතුව ඇත:

| | රු. |
|---|---|
| විදුලිය | 300,000 |
| ජලය | 150,000 |

(9) 2019/20 තක්සේරු වර්ෂය සඳහා සමාගමේ ආදායම් බදු වගකීම රු.2,300,000/- ක් ලෙස ඇස්තමේන්තු ගතකර ඇත.

(10) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2020 ජූනි 05 දින මූල්‍ය ප්‍රකාශන නිකුත්කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

ඉහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගනිමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත ධයනා සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභා'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 10)

(b) 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 08)

(c) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 03)

(d) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අදින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව නිරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය නිරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |